සන්නස පසුගිය කළාපයේ පළ වූ **ජාතික ඇඳුම** කෙටිකතාව
රධනිකා අතුකෝරල ගේ
නිර්මාණයක් බව සළකන්න.

කෙටිකතාව සමගින් රචිකාව ගේ නම සඳහන් නොවීම පිලිබඳව අපේ කණගාටුව




# ඉනාව

**මා**ර්තා මීර්හැම් මෙනවිය වීදියේ කොණක කුඩා කඩ කාමරයක බේකරියක් පවත්වා ගෙන ගියාය. (ගල් පඩි තුනක් ඉහලට නැගගෙන ගිය තැන ඇති එම කඩයේ දොර ඇරිය විට සීනුවක් නාද වේ.)

වයස අවු හතලිහක් වු මාර්තා සතුව ඩොලර් දෙදහසක බැංකු ගිණුම් තැන්පතුවක්, බොරු දත් දෙකක් සහ වහා උණු වන සුළු හදවතක් තිබුණි. එසේ වුවද මාර්තාට වඩා වත් පොහො සත්කමෙන් අඩු බොහෝ දෙනා ඒ වන විට විවාහ ගිවිස ගෙන සිටියහ.

සතියකට දින දෙකක් හෝ තුනක් පැමිණෙන ගනුදෙණුකරුවෙකු පිළිබඳව ඇගේ සිත තුල උනන්දුවක් පහළ වෙන්නට පටන් ගෙන තිබුණි. උපැස් යුවලක් පළඳින, සීරුවට කපා ඇති සිහින් උඩු රැවුලක් සහිත ඔහු මැදි වියේ පුද්ගලයෙකි. ඔහු ඉංග්‍රීසි කතා කලේ ජර්මානු බස හසුරුවන අයුරිනි. ඔහුගේ ඇඳුම් තැනින් තැන දියවී අණ්ඩ දමා තිබුණි. නැතහොත් හැකිලී හෝ දික් වී තිබුණි. නමුත් ඔහු තුල ක්‍රමානුකුල බවක් පෙන්නුම් කල අතර ඉතා විනීත ගති පැවතුම් වලින් යුතු විය.

ඔහු බේකරියට පැමිණි සෑම විටෙකම පරණ පාන් ගෙඩි දෙකක් මිලදී ගත්තේය. අළුත් පාන් ගෙඩියක මිල ශත පහකි. ඒ මුදලට පරණ පාන් ගෙඩි දෙකක් ගත හැකි විය. ඔහු කිසි දිනෙක පරණ පාන් හැර වෙනත් කිසි දෙයක් මිලදී ගෙන නැත.

වරක් මාර්තා මෙනෙවිය ඔහුගේ ඇඟිලිවල ඇති රතු සහ දුඹුරු පැහැති පැල්ලමක් දුටුවාය. ඒ තුලින් ඇය ඔහු ඉතා දිළිඳු කලා කරුවෙකු බව සහතික කර ගත්තාය. ඔහු කොහේ හෝ නිවෙසක කුඩා අටල්ලක ජීවත් වෙමින් චිත්‍ර අඳිනවා විය යුතුය. මාර්තාගේ බේකරියේ කෑමට තබා ඇති රසවත් කෑම ගැන සිතමින් පරණ පාන් කනවා වෙන්නට පුළුවන.

මස් පෙත්තක් දෙකක්, සැහැල්ලු පාන්, ජෑම් සමග තේ මේසයට වාඩි වෙන සෑම මොහොතකම ඇය සුසුමක් හෙළා මෘදු ගතිගුණ ඇති සිත්තරාට සීතල අට්ටාලයකට වී වේලී ගිය පාන් වලින් වේල සප්පායම් වෙනු වෙනුවට තමා සමග රසවත් ආහාර හවුලේ භුක්ති විඳීමට ලැබේවායි පතන්නීය.

මෙයට පෙරද කියා ඇති පරිදි මාර්තාගේ හදවත කරුණාබරිත එකකි.
ඔහුගේ වෘත්තිය පිළිබඳව තමා බැස ගත් නිගමනය තහවුරු කර ගනු වස් මාර්තා වරක් වෙළඳපොලෙන් මිලදී ගෙනැවිත් සිය කාමරයේ තබා තිබු පින්තූරයක් බේකරියේ පාන් අසුරා ඇති කවුන්ටරය පිටුපස රාක්කයට හේත්තු කොට තැබුවාය.

එය වැනිසියේ දර්ශනීය පින්තූරයකි. දර්ශනයේ ඉදිරිපස කොටසට වෙන්නට නැතහොත් ගඟ අද්දරට වෙන්නට මනස්කාන්ත කිරිගරුඬ ප්‍රාසාදයකි (පින්තූරයේ හඳුන්වා දී ඇති පරිදි). සෙසු පසුතලය ගඟ දියට අත පොවා සිටින කාන්තාවක් සිටින බෝට්ටුවක් ඇතුළු මගී බෝට්ටු, වළාකුළු, අහස, ඇතුළුව අඳුරු සහ ආලෝකමත් පින්සල් පහරවල් වලින් පුරවා තිබේ. එය කිසිදු සිත්තරෙකුගේ නෙතින් මග හැරෙන ආකාරයේ පින්තූරයක් නොවේ.

දින දෙකකට පසු අපේක්ෂිත ගණුදෙනුකරුවා බේකරියට ගොඩ වුනේය.

''ඔබ කැමති නම් මට කරුණාකරල පරණ පාන් ගෙඩි දෙකක් දෙනවද.? අහ්! නෝනා.. ඔබ ළඟ ලස්සන පින්තූරයක් තියෙනවානේ..'' මාර්තා පාන් ඔතන අතර ඔහු සුපුරුදු ජර්මානු උච්ඡාරණයෙන් කීවේය.
''ඔව්'' මාර්තා සිය සටකපට කම ගැන සිත යටින්

## කෙටි කතාව

ඕ හෙන්රි ගේ
විචස් ලෝව්ස් නමැති කෙටි කතාව ඇසුරිනි.
පරිවර්තනය
**ශ්‍රියා කුමාරසිංහ**

උද්දාම වෙමින් පිළිතුරු දුන්නාය. ''මම කලාවට (නැහැ, මෙවවර ඉක්මණට කලා කරුවන්ට කැමතියි කියන එක හරි නැහැ.) හරි කැමතියි. චිත්‍ර වලටත් ඒ වගේම.'' ඇය වචන ආදේශ කරමින් කීවාය. ''ඔබ හිතනවාද මේක හොඳ චිත්‍රයක් කියලා?''
'මේ ප්‍රාසාදෙ නම්..'' ගනුදෙනුකරුවා සිය සුපුරුදු ජර්මන් හඬ අවදි කලේය. ''එච්චර හොඳට ඇඳලයි කියල කියන්න බෑ. දර්ශනය තාත්වික එකක් නෙවෙයි. ඔබට සුබ උදෑසනක් වේවා.'' ඔහු පාන් ගෙඩි දෙක ගෙන, හිස නමා ආචාර කොට කලබලයෙන් පිටවී ගියේය.

හරියටම හරි. ඔහු නම් චිත්‍ර අඳින කෙනෙක් තමයි. මාර්තා මෙනෙවිය පින්තූරය ආපසු සිය කාමරයට රැගෙන ගියාය.
උපැස් යුවලට පිටුපසින් පෙනෙන ඔහුගේ දෙනෙත් කොයි තරම් මෘදුද! කරුණාවන්තද! ඇහි බැම කොච්චර නම් විශාලද! එක බැල්මෙන්ම චිත්‍රය ගැන නිගමනයක් දෙන්න පුළුවන් වුන හැටි! ඒ වුනාට ජීවත් වෙන්නෙ පරණ පාන් කාලා! ඒත් හැම ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකුටම වගෙ ලෝකෙ තමාව හඳුනා ගන්න කල් ඔය වගෙ දුක් විඳින්න වෙනවනෙ. එහෙම ශ්‍රේෂ්ඨ කෙනෙකුට ඩොලර් දෙදාහක බැංකු ගිණුමකිනුයි, බේකරියකිනුයි, සානුකම්පික හදවතකිනුයි උදව් කරන්න පුළුවන් වුනොත් එයාගෙ චිත්‍රයි, පසුතල දර්ශනයි කොහොම හිටීවිද - ඒත් ඒව දවල් හීන විතරයි මාර්තා.

දැන් දැන් ඔහු බේකරියට පැමිණි විට වීදුරු රාක්කයේ අනෙක් පැත්තේ සිට මඳ වේලාවක් කතාබහ කරයි. ඔහු මාර්තා මෙනෙවියගේ ළගන්නා වදන් වලට වහ වැටිලා වගෙයි. ඔහු දිගටම මිලදී ගත්තේ පරණ පාන්මය. කේක් ගෙඩියක්, මසවුලක්, වෙන එකක් තබා මාර්තාගේ අතින් හැදෙන සැලී ලුන් පාන් ගෙඩියක්වත් ගත්තේ නැත.

ඔහු කෙට්ටු වී උදාසීන බවක් පෙනෙන්නට ඇතැයි ඇයට සිතුණි. ඔහු මිලදී ගන්නා ඉතා සුළු ආහාර වේලට රසවත් යමක් එකතු කර දෙන්නට ඇත්නම් කියා ඇගේ හදවත මොර ගෑවේය. නමුත් එසේ කිරීමට ඇයට ආත්ම ශක්තියක් නොතිබුණි. ඔහුට මදිපුංචි කමක් වේ යයි ඇයට බියක් දැනුණි. කලාකරුවන් සතු අභිමානය ගැන ඇය දැන සිටියාය.

මාර්තා මෙනෙවිය කවුන්ටරය පිටුපස වැඩ කරන විට නිල් පාට තිත් වැටුණු සිල්ක් ඇඳුමක් අඳින්නට පටන් ගත්තාය. පිටුපස කාමරයේ සිට විවිධ මාදිලියේ පලතුරු, ඇට වර්ග, සහ සෝඩා මුසු කරමින් අමුතුම මාදිලියේ කෑම වර්ග සෑදුවාය. මෙතෙක් කිසිවෙක් එතරම් සංකීර්ණ කෑම වර්ග සාදා නැති තරම්ය.

දිනක් පුරුදු පරිදි බේකරියට පැමිණි ගනුදෙනුකරුවා කාසිය වීදුරු පෙට්ටිය මත තබා තමා හැම විටම මිලදී ගන්නා පරණ පාන් ඉල්ලා සිටියේය. මාර්තා ඒ සඳහා අත දිගු කරන විටම පලාතම දෙදරුම් කන පරිදි නලා හඬවමින් ගිනි නිවන රථයක් පැමිණියේය. අන් ඕනෑම කෙනෙකු මෙන් අපේ ගනුදෙණු කරුවාද එය බැලීමට දොර වෙත ගියේය. මාර්තා මෙනෙවිය වහා එම අවස්ථාවෙන් ප්‍රයෝජන ගත්තාය.

කවුන්ටරය පිටුපස රාක්කයේ පහල තට්ටුවේ වුයේ ඊට විනාඩි දහයකට පමණ පෙර කිරි කාරයා විසින් ගෙන ආ අළුත්ම බටර් රාත්තලකි. පාන් කපන පිහිය අතට ගත් මාර්තා පරණ පාන් ගෙඩි දෙකේම ගැඹුරු කැපුමක් සාදා සෑහෙන තරම් විශාල බටර් පෙති දෙකක් ඒ තුලට රිංගවා පාන් ගෙඩි දෙක නැවත එකට තබා තද කලාය. ගණුදෙනුකරු ආපසු එදෙසට හැරෙන විට ඇය එය වටා කඩදාසි ඔතමින් සිටියාය.

වෙන කවරදාවත් නොවු අන්දමේ ප්‍රිය ජනක කෙටි වචන හුවමාරුවකින් අනතුරුව ඔහු පිටවී ගිය පසු මාර්තා මෙනෙවිය තනිවම සිනාසුණාය. නමුත් හදවතේ සුළු ගැස්මක් නැතිවම නොවේ. තමා ඕනෑවට වඩා එඩිතර වුණාද? ඔහු තරහ ගනීවිද? නැහැ. කොහෙත්ම එහෙම වෙන එකක් නැහැ. කෑමකට වචන හුවමාරු කර ගන්නෙ කවුද? ඇරත් බටර් කියන්නෙ ගෑණු කම ඉක්මවා ඉදිරියට ගිය බවක් හැගවෙන සංකේතයක් නොවෙයි.
එදින බොහෝ වේලාවක් ගත වන තුරු එම සිද්ධිය ඇගේ මනසින් පහව ගියේ නැත. ඔහුට ඇගේ කුඩා ප්‍රයෝගය හෙළි දරව් වෙන මොහොත ඇය සිතේ මවා ගැනීමට උත්සාහ කලාය.
ඔහු පින්සල් සහ සායම් පුවරුව හෙමිහිට පසෙකින් තබනු ඇත. සියළු විවේචන ඉක්මවා යන අන්දමේ විශිෂ්ට පසුතලයක් සහිතව තමා අඳිමින් සිටින චිත්‍රය අබියස ඔහු මඳ වේලාවක් සිටගෙන සිටිනු ඇත. පාන් සහ වතුර වලින් සමන්විත ඔහුගේ දිවා ආහා රය ගැනීමට සූදානම් වනු ඇත. ඔහු පාන් ගෙඩිය පෙති වලට කපද්දී - - අහ්! මාර්තා මෙනෙවිය ලජ්ජාවෙන් හැකුළුණාය. ඔහු එය අනුභව කරන අතරවාරයේ බටර් එතුලට දැමූ අත ගැන කල්පනා කරනු ඇද්ද ඔහු..?

ඉදිරිපස දොරේ සීනුව ප්‍රචණ්ඩ ලෙස නාද විය. මහ හඬක් නගමින් කවුරුන් හෝ එමින් සිටී. මාර්තා මෙනෙවිය කලබලයෙන් බේකරියේ ඉදිරිපස කොටසට ගියාය. මිනිස්සු දෙදෙනෙක් එහි සිටියහ. එක් අයෙකු දුම් පයිප්පයක් උරමින් සිටින තරුණයෙකි. ඇය මීට පෙර ඔහු දැක නැත. අනෙක් තැනැත්තා ඇගේ සිත්තරාය.

ඔහුගේ මුහුණ තද රතු පැහැයක් ගෙන ඇත. තොප්පියද හිසේ පිටුපසට ගොසිනි. හිසකෙස් ද හොඳටම අවුල් වී ඇත. ඔහු සිය දෑතම මිට මොලවා මාර්තා මෙනෙවිය දෙසට එල්ල කර දරුණු ලෙස සොලවයි. මේ මාර්තා මෙනෙවිය දෙසට!

''මෝඩී'' ඔහු ජර්මානු බසින් යටි ගිරියෙන් කෑ ගැසුවේය. ඉන් පසුව තවත් කුමක්දෝ ජර්මානු වචනයක් කීවේය. තරුණයා ඔහුව ඉවතට ඇද ගෙන යාමට උත්සාහ දැරීය.
''මම යන්නෙ නෑ.'' ඔහු තරහෙන් පුපුරමින් කැඩුණු ඉංග්‍රීසියෙන් දෙඩීය. ''උඹ කියන්නෙ නැත්නම් මම කියන්නම්.''

ඔහු බෙරයකට තලන්නාක් මෙන් මාර්තා මෙනෙවියගේ කවුන්ටරයට පහර දුන්නේය.

''උඹ මාව කෑවා. ඔහු වැලපුනේය. උපැස් යුවලය පිටුපසින් ඔහුගේ නිල් පැහැති ඇස් දිළිසුණි. ''මං කියන්නෙ.. උඹ නම් අනුන්ගෙ වැඩ අවුල් කරන කමකට නැති නාකි බැලළියක්.. ''

මාර්තා මෙනෙවිය අප්‍රාණික ව ඇලවී ගොස් කවුන්ටරයට හේත්තු වී එක අතක් ඇගේ නිල් පැහැති තිත් වැටුණු සිල්ක් ඇඳුම මත රැඳවුවාය. තරුණයා සිය සගයාගේ කමිස කොලරයෙන් අල්ලා ගත්තේය.
''වරෙන් යන්න. උඹ ඔය කෑගැහුව හොඳටම ඇති.'' ඔහු තරහෙන් පුපුරා හැලෙන මිනිසා දොරෙන් එලියට ඇදගෙන ගොස් පාර අයිනේ නවතා නැවත ඇතුලට ආවේය.

''මං හිතනව..'' ඔහු කීවේය. ''මේ කලබලේ මොකද්ද කියල නෝනා මහත්මියටත් කිව්වොත් හොඳයි කියල. අරය ගෙ නම බ්ලුම්බර්ගර්. එයා ගෘහ නිර්මාණ ශිල්පියෙක්. එයයි මමයි එකම කන්තෝරුවෙ වැඩ කරන්නෙ. එයා පහුගිය මාස තුන තිස්සෙ අළුත් නගර ශාලාවෙ සැලැස්ම අඳින්න හරියට මහන්සි වුනා. ඒක තෑගි දිනන තරගයක්. ඔහු රේඛා සටහන් උඩ තීන්තෙන් ඇඳල ඉවර කලේ ඊයෙ. ඔබ දන්නවනෙ. හැම සැලසුම් ශිල්පියෙකුම මුලින්ම දළ සටහන අඳින්නෙ පැන්සලෙන්'. ඔහු ඒක ඉවර උනහම පරණ පාන් කුඩු අතුල්ලල පැන්සල් ඉරි මකල දානව. ඉන්දියානු රබර් වලට වැඩිය ඒව හොඳයි ඒ වැඩේට. බ්ලුම්බර්ගර් මෙහෙන් දිගටම පාන් මිලදී ගත්ත. ඉතින් අද.. ඉතින් ඔබ දන්නවනෙ. ඒ වැඩේට බටර් හරි යන්නෙ නැති විත්තිය. දැන් ඉතින් ඒ සැලැස්ම කෑලි වලට කපල සැන්ඩ්විච් ඔතනව ඇරෙන්න වෙන වැඩක් ගන්න බැහැ.''

මාර්තා මෙනෙවිය පිටුපස කාමරයට ගියාය. නිල් පැහැ තිත් වැටුණු සිල්ක් ඇඳුම ගලවා දමා හැමදාම පාහේ අඳින පැරණි දුඹුරු පැහැ ඇඳුම ඇඟ ලා ගත්තාය.ඉන් පසුව පලතුරු ඇට සහ සෝඩා යෙදූ පාන් මිශ්‍රණය ජනේලයෙන් පිටත අළු ගොඩට හැළුවාය. ■

ශ්‍රී ලාංකික ඔබේ රියදුරු පාසල
Ravin රවින්
Professional / Patient Instructor
Easy Learning Techniques
Exceptional Pass Rate
Iyoka
Driving School
Training Excellence
Tel : 94021196
Mobile : 0433028029
iyoka_ds@yahoo.com.au